දුරකථන/தொலைபேசி இல./Telephone Nos.
අමාත්‍ය / அமைச்சர் / Minister } 2784832, 2784807, 2785617
ලේකම් / செயலாளர் / Secretary } 2784812
කාර්යාලය / அலுவலகம் / Office } 2785141-50, Fax: 2784846
විද්‍යුත් තැපෑල/மின்னஞ்சல்/E-mail : isurupaya@moe.gov.lk
ඔබේ අංකය / உமது இல. / Your No. } ..................................

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education
"ඉසුරුපාය"
බත්තරමුල්ල.
"இசுருபாய"
பத்தரமுல்ல.
"Isurupaya"
Battaramulla.
පාසල් කටයුතු හා පෞද්ගලික පාසල් ශාඛාව
මගේ අංකය / எனது இல. / My No. } ED/01/12/06/15/01
දිනය / திகதி / Date } 2008.09. 15

**චක්‍රලේඛ අංක : 2008/12 (1)**

සියලුම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
සියලුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලුම රජයේ හා රජයේ අනුමත පෞද්ගලික පාසල්වල විදුහල්පතිවරුන් වෙත.

## ද්විතීයික ශ්‍රේණි (6-11) සඳහා නව විෂයමාලාව ක්‍රියාත්මක කිරීම

ද්විතීයික ශ්‍රේණි (6-11) සඳහා නව විෂයමාලාව ක්‍රියාත්මක කිරීම පිළිබඳව මීට පෙර නිකුත් කර ඇති 2006.03.07 දිනැති අංක 2006/09 චක්‍රලේඛය හා 2007.03.07 දිනැති අංක 2007/06 සහ 2008.04.21 දිනැති අංක 2008/12 චක්‍රලේඛ සංශෝධනයන්වලට අමතරව මෙම චක්‍රලේඛ සංශෝධන ද මින් ඉදිරියට බලපැවැත් වේ.

අංක 2008/12 දරන චක්‍රලේඛයේ උප වගන්ති 4.5 හි ඛාණ්ඩ විෂයයන් යටතේ vii. වෙනි විෂයය ලෙස ව්‍යාපාර හා ගිණුම්කරණය ඇතුළත් කර ගත යුතු ය.

මෙම චක්‍රලේඛයෙන් සංශෝධනය වන කරුණු හැර අනෙකුත් සියලුම උපදෙස් ඉහත සඳහන් චක්‍රලේඛයන්ට අනුකූලව විය යුතු ය.

එම්.එම්.එන්.ඩී. බණ්ඩාර
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

පිටපත්

1. සභාපති, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව - දැ.ගැ.ස.
2. සභාපති, ජාතික අධ්‍යාපන කොමිෂම - දැ.ගැ.ස.
3. අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අධ්‍යාපන ආයතනය - අවශ්‍ය කටයුතු සඳහා
4. විභාග කොමසාරිස් ජනරාල්, විභාග දෙපාර්තමේන්තුව - අවශ්‍ය කටයුතු සඳහා
5. අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව - අවශ්‍ය කටයුතු සඳහා

දුරකථන /தொலைபேசி இல./Telephone Nos.

අමාත්‍යතුමා / அமைச்சர் / Minister } 2784832 Fax: 2784825

ලේකම් / செயலாளர் / Secretary } 2784812

කාර්යාලය / அலுவலகம் / Office } 2785141-50 Fax: 2784846

ඊමේල්/ஈ-மெயில்/E-mail : isurupaya@moe.gov.lk

ඔබේ අංකය / உமது இல. / Your No. } ......................

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

"ඉසුරුපාය"
බත්තරමුල්ල.

'இசுருபாயா'
பத்தரமுல்ல.

"Isurupaya"
Battaramulla.

පාසල් කටයුතු හා පෞද්ගලික පාසල් ශාඛාව

මගේ අංකය / எமது இல. / My No. } ED/01/12/06/15/01

දිනය / திகதி / Date } 2008.04. 21

**චක්‍රලේඛ අංක : 2008/12**

සියලුම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
සියලුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලුම පිරිවෙන්වල පරිවේණාධිපති හිමිවරුන්,
සියලුම රජයේ හා රජයේ අනුමත පෞද්ගලික පාසල්වල විදුහල්පතිවරුන් වෙත.

## ද්විතියික ශ්‍රේණි (6-11) සඳහා නව විෂයමාලාව ක්‍රියාත්මක කිරීම

ද්විතියික ශ්‍රේණි (6–11) සඳහා නව විෂයමාලාව ක්‍රියාත්මක කිරීම පිළිබඳව මීට පෙර නිකුත් කර ඇති 2006.03.07 දිනැති අංක 2006/09 චක්‍රලේඛය හා 2007.03.07 දිනැති අංක 2007/06 චක්‍රලේඛ සංශෝධනයට අමතර වශයෙන් මෙම චක්‍රලේඛයේ විධිවිධාන ද මින් ඉදිරියට බලපැවැත් වේ.

1. සෞන්දර්ය විෂයයන් යටතේ 6 – 9 ශ්‍රේණි සඳහා සාහිත්‍ය රසාස්වාදය විෂයය ඉවත් කර ඇති අතර එම විෂයය 10 – 11 ශ්‍රේණිවල සිසුන්ට පෙර පරිදිම හැදෑරිය හැකිය.

2. 10 – 11 ශ්‍රේණි සඳහා ලබා දී ඇති වෙන් නොකරන ලද කාලච්ඡේදයන් ගෙන් එක් කාලච්ඡේදයක් ශාරීරික අධ්‍යාපනය සඳහා වෙන් කර ඇති අතර තවත් කාලච්ඡේදයක් ජාතික අවශ්‍යතාවක් ලෙස සලකා කෘෂිකාර්මික කටයුතු සඳහා වෙන් කළ යුතුය. මෙම අතිරේක කාලච්ඡේදයේදී අදාල පංතියේ/පංතිවල සියළුම සිසුන් ඒ සඳහා සහභාගී කර ගැනීමට වගබලා ගත යුතුය. ඉතිරි කාලච්ඡේදය විදුහලේ කළමනාකරණ මණ්ඩලය විසින් තීරණය කරනු ලබන විෂයයන්, අධ්‍යයන කාර්යයන් සහ ක්‍රීඩා සාහිත්‍ය සංගම් වැනි විෂයය සමගාමී කටයුතු සඳහා යොදා ගත යුතු ය.

3. පුස්තකාල භාවිතය සඳහා වෙන් වී ඇති කාලච්ඡේදය විධිමත් ලෙස භාවිත කිරීම සම්බන්ධයෙන් පාසල් ප්‍රතිපත්තියක් සකස් කර ඒ අනුව කටයුතු කළ යුතු වේ.

### 4. ද්විමාධ්‍ය පංති පැවැත්වීම

4.1 6 – 11 ශ්‍රේණි සඳහා සමහර විෂයයන් සිංහල/ දෙමළ භාෂාවෙන් ද තෝරාගත් විෂයයන් කිහිපයක් ඉංග්‍රීසි භාෂාවෙන් ද එකම පංතියේ (මාධ්‍ය දෙකකින් / ද්විමාධ්‍යයෙන්) ඉගැන්වීම ද්විමාධ්‍ය පංති වශයෙන් හැඳින්වේ.

4.2 ඉංග්‍රීසි භාෂාවේ අවශ්‍යතාව හා වැදගත්කම සැලකිල්ලට ගෙන 2002 වර්ෂයේ සිට 6 – 11 ශ්‍රේණි සඳහා සමහර විෂයයන් ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉගැන්වීමට ඒ සඳහා අවශ්‍ය පහසුකම් පවතින පාසල්වලට අවසර දෙන ලදී.

2007 වර්ෂයේ සිට ද්විතීයික ශ්‍රේණිවල (6-11) ක්‍රියාත්මක වන නව විෂයමාලාව යටතේ මෙම ද්විමාධ්‍ය පංතිවල උගන්වනු ලබන විෂයයන් සඳහා මින් ඉදිරියට පහත සඳහන් විධිවිධාන බලපැවැත් වේ.

4.3 පාසල්වල ද්විමාධ්‍යයෙන් ඉගෙනුම ලබන සිසුන් සඳහා වෙනම පංතියක් ආරම්භ නොකළ යුතුය. සිංහල හෝ දෙමළ මාධ්‍ය හෝ සිසුන් සමග ඉහත සිසුන් ද එකම පංතියේ සිටිය යුතු අතර අදාළ විෂයයන් ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉගෙනගන්නා අවස්ථාවන්හි දී පමණක් වෙන්වී යා යුතුය. මේ ආකාරයට ක්‍රියාත්මක විය හැකි පරිදි පාසල් කාලසටහන සකස් කර ගැනීම විදුහල්පතිගේ වගකීම වේ. (2009 වසරේ සිට අනිවාර්යයෙන්ම ඉහත උපදෙස් පරිදි ක්‍රියා කළ යුතු ය). තෝරාගත් විෂයයන් ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉගෙනීම සඳහා තෝරාගත යුත්තේ පාසලේ 6 ශ්‍රේණියේ සිසුන් අතරිනි. පාසලට ඇතුළත්වීම සඳහා ද්විමාධ්‍ය පංතිය උපයෝගී කර ගැනීමට ඉඩකඩ නොදිය යුතුය.

4.4 **කණිෂ්ඨ ද්විතීයික ශ්‍රේණි (6 – 9) ශ්‍රේණි සඳහා ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉගැන්විය හැකි විෂයයන්**

i. ගණිතය
ii. විද්‍යාව
iii. සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය
iv. සෞන්දර්යය විෂයයන් යටතේ සංගීතය (අපරදිග)
v. භූගෝල විද්‍යාව
vi. ජීවන නිපුණතා හා පුරවැසි අධ්‍යාපනය

ඉහත සඳහන් විෂයයන් අතුරින් උපරිම වශයෙන් ඕනෑම විෂයයන් 05 ක් ඉංග්‍රීසි මාධ්‍යයෙන් හැදෑරීම සඳහා තෝරාගත හැකි ය.

4.5 **ජ්‍යෙෂ්ඨ ද්විතීයික ශ්‍රේණි (10 -11) සඳහා ඉංග්‍රීසි මාධ්‍යයෙන් හැදෑරිය හැකි විෂයයන්**

හර විෂයයන් යටතේ

i. ගණිතය
ii. විද්‍යාව

කාණ්ඩ විෂයයන් යටතේ

i. භූගෝල විද්‍යාව
ii. පුරවැසි අධ්‍යාපනය හා ප්‍රජා පාලනය
iii. ව්‍යවසායකත්ව අධ්‍යයනය
iv. සංගීතය (අපරදිග)
v. තොරතුරු සන්නිවේදන තාක්ෂණය
vi. සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය

හර විෂයයන් අතරින් ඉහත සඳහන් විෂයයන් 02 ද කාණ්ඩ විෂයයන් යටතේ සඳහන් විෂයයන් අතරින් ඕනෑම කාණ්ඩයකින් එක් විෂයයක් බැගින් විෂයයන් 03 ක් ද වශයෙන් විෂයයන් 05 ක් ඉංග්‍රීසි මාධ්‍යයෙන් හැදෑරීම සඳහා තෝරාගත හැකි ය.

4.6 අංක 4.4 හා 4.5 හි සඳහන් සීමාවන් අ.පො.ස.(සාමාන්‍ය පෙළ) විභාගයට පෙනී සිටින පෞද්ගලික අයදුම්කරුවන්ට බල නොපැවැත් වේ.

4.7 6 — 11 දක්වා ශ්‍රේණිවලට ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉගැන්විය යුතු විෂයයන් සංඛ්‍යාව පාසලේ පවතින භෞතික හා මානව සම්පත් අනුව පාසල විසින් තීරණය කළ යුතුය. මෙය ඉංග්‍රීසි විෂය හැර අවම වශයෙන් එක් විෂයයක් හෝ උපරිම වශයෙන් විෂයයන් 05 ක් හෝ විය හැකිය. ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉගැන්වීමට හැකි ඉහත සඳහන් විෂයයන් අතුරින් ඉගැන්වීමට තීරණය කරනු ලබන විෂය හෝ විෂයයන් හෝ පිළිබඳව විදුහල්පති විසින් අධ්‍යාපන අමාත්‍යාංශයේ ද්විභාෂා අධ්‍යාපන ඒකකය දැනුවත් කළ යුතුය.

4.8 ශිෂ්‍යයා ඉංග්‍රීසි මාධ්‍යයෙන් විෂයයන් කීපයක් ඉගෙනගනු ලැබුව ද පාසල් අයදුම්කරුවන් වශයෙන් අ.පො.ස. (සා.පෙ) විභාගය සඳහා අයදුම්පත්‍ර ඉදිරිපත් කිරීමේ දී ශිෂ්‍යයාගේ අභිමතය පරිදි විෂයයක් හෝ විෂයයන් කිහිපයක් හෝ සඳහා ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉල්ලුම් කළ හැකිය. එහෙත් ඉන්පසු කිසිඳු හේතුවක් නිසා හෝ ඉල්ලුම් කරන ලද මාධ්‍ය වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

4.9 2009 වසරේ 6 වන ශ්‍රේණියේ සිට ක්‍රියාත්මක වන පරිදි ඉතිහාසය විෂය ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉගැන්විය නොහැකිය. එහෙත් දැනටමත් ඉතිහාසය විෂයය ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉගෙන ගැනීම ආරම්භ කර ඇති සිසුන්ට 11 ශ්‍රේණිය දක්වා ඉතිහාසය විෂයය ඉංග්‍රීසි මාධ්‍යයෙන් අඛණ්ඩව හැදෑරිය හැකි ය.

මෙම චක්‍රලේඛයෙන් සංශෝධනය වන කරුණු හැර අනෙකුත් සියලුම උපදෙස් 2006/09 හා 2007/06 චක්‍රලේඛයන්ට අනුකූලව විය යුතු ය.

එම්.එම්.එන්.ඩී. බණ්ඩාර
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

පිටපත්

1. සභාපති, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව – දැ.ගැ.ස.
2. සභාපති, ජාතික අධ්‍යාපන කොමිෂම – දැ.ගැ.ස.
3. අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අධ්‍යාපන ආයතනය – අවශ්‍ය කටයුතු සඳහා
4. විභාග කොමසාරිස් ජනරාල්, විභාග දෙපාර්තමේන්තුව – අවශ්‍ය කටයුතු සඳහා
5. අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව – අවශ්‍ය කටයුතු සඳහා